# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2021.10.29 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

**01.** **<u>සහකාර ගොවිපල කළමනාකරු</u>**
**අවශ්‍ය සුදුසුකම්:**

i. පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ විශේෂ උපාධියක් ලබා තිබීම.

**සටහන:** උපාධිය ලැබීමෙන් පසු පිළිගත් ආයතනයක වසරකට නොඅඩු ක්ෂේත්‍ර පළපුරුද්දක් ඇති අය සඳහා ප්‍රමුඛතාවක් ලබා දෙනු ඇත.

**හෝ**

ii. පිළිගත් ආයතනයක කෘෂිකර්මය පිළිබඳ වසර දෙකක සම්පූර්ණ කරන ලද ඩිප්ලෝමාව සමඟ එකී සුදුසුකම් සපුරා ගැනීමෙන් අනතුරුව ලබාගත් පිළිගත් ආයතනයක වසර තුනකට නොඅඩු ක්ෂේත්‍ර පළපුරුද්ද.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 42,885 - 20×660 - 1×660 - 56,745.00 [U-MN 4(II) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

**02.** **<u>මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය)</u>**
**අවශ්‍ය සුදුසුකම්:**

i. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් වීම හා එම සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු වශයෙන් අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 31,625 -7×300; 10×355 - 37,275.00 [U-MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

**03.** **<u>හෙද නිලධාරී (II ශ්‍රේණිය) තනතුර (කාන්තා)</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය මඟින් පිළිගනු ලබන හෙදි යෝග්‍යතා සහතිකයක් තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 31,625 -7×300; 10×355 - 37,275.00 [U-MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

**04.** **<u>විනයාරක්ෂක (II ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

(1) i. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.

ii. ශාරීරික සුදුසුකම්: පිරිමි - උස අඩි 5 අඟල් 5 ට නොඅඩු විය යුතුය.
- පපුව අඟල් 32 (සාමාන්‍ය) ක් විය යුතුය.

ගැහැණු - උස අඩි 5 අඟල් 4 ට නොඅඩු විය යුතුය.

iii.වයස අවුරුදු 30 ට වැඩි විය යුතුය.

**සටහන:** පොලිස් / සන්නද්ධ හමුදා සේවා පසුබිමක් ඇති සහ විශ්වවිද්‍යාල හා ජාතික මට්ටමේ ක්‍රීඩා කටයුතු හා සමාජ සුභසාධක කටයුතුවලදී ක්‍රියාකාරී ලෙස සහභාගි වී ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**හෝ**

(2) ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවේ මේජර් තනතුරට වඩා නොඅඩු තනතුරක සේවා පළපුරුද්ද ඇති හෝ ශ්‍රී ලංකා පොලිසියේ ඉහත තනතුරට සමාන හෝ ඊට නොඅඩු තනතුරක සේවා පළපුරුද්දක් තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 42,885 -18×660 - 54,765.00 [U-MN 3(II) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

## 05. <u>විගණන සහකාර (II ශ්‍රේණිය)</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. අ.පො.ස. (සා.පෙළ) පරීක්ෂණය

- i. සිංහල/දෙමළ
- ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍යය
- iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් එක් වරකදී සමත්ව තිබිය යුතුය.

**සහ**

ii. අ.පො.ස. (උ.පෙළ) පරීක්ෂණය එක් වරක දී (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර) සියලු විෂයයන් සමත් වීම. (පැරණි විෂයය නිර්දේශය යටතේ එක් වරක දී විෂයයන් තුනක් සමත් වී තිබීම ප්‍රමාණවත් වේ.)

**සහ**

iii. (අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ප්‍රාථමික අදියර/ විධායක අදියර/ ආවසරික 1/ පදනම් අදියර සමත් වී තිබීම.

**හෝ**

(ආ) ශ්‍රී ලංකා වරලත් කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ පදනම් අදියර සමත් වීම

**හෝ**

(ඇ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමත් වී තිබීම.

**හෝ**

(ඉ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සමාජිකත්වය ලබා තිබීම.

**සහ**

iv. රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 02 ක විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**සටහන:** අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ/ රාජ්‍ය අංශයේ/ පිළිගත් පෞද්ගලික සංවිධානයන්හි ගණකාධිකරණ/ විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඉහත (iv) හි සඳහන් විගණන ක්ෂේත්‍රයේ පළපුරුද්ද වෙනුවෙන් සලකා බලනු ඇත.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 37,275 -18×495 - 46,185.00 [U-MN 2(II)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

## 06. <u>පරිපාලක - භූමිදර්ශක (III ශ්‍රේණිය)</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) (i) දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් විෂයයන් 06 කින් සමත් වීම.

**සහ**

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ ඊට සමාන ආයතනයක් විසින් පවත්වනු ලබන එක් අවුරුදු ප්‍රායෝගික පුහුණු පාඨමාලාවක් සාර්ථකව නිම කිරීම.

**හෝ**

(ආ) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී සමත් වී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සහ/හෝ උද්භිද උද්‍යානයක භූමිදර්ශන කටයුතු පිළිබඳ වසර 10 ක අත්දැකීම් ලබා ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතු අයෙකු වීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 31,625 -7×300; 10×355 -37,275.00 [U-MT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

## 07. <u>තාක්ෂණික නිලධාරී (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ICT)</u>

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උ/පෙළ) විභාගය , එකම වතාවක දී විෂයන් තුනකින් (03) සමත් වීම.

**සහ**

(ආ) තොරතුරු සන්නිවේදන හා බහුමාධ්‍ය තාක්ෂණවේදය/ තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය හෝ සමාන ක්ෂත්‍රයකින් , පිළිගත් ආයතනයකින් හෝ පිළිගනු ලබන තාක්ෂණික/ කාර්මික/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරනු ලැබූ ජාතික වෘත්තීය කුසලතා (N.V.Q.) 5 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**සටහන** : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) පිළිබඳ සේවාස්ථ පළපුරුද්දක් සහිත අය හට ප්‍රමුඛතාවක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය:** 31,625 - 7×300; 10×355 - 37,275.00 [U-MT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි

**08.** **<u>තාක්ෂණික නිලධාරී - ශ්‍රේණිය II කණ්ඩය "අ"</u>**
**අවශ්‍ය සුදුසුකම්:**

i. ජාතික තාක්ෂණවේද ඩිප්ලෝමාව (NDT) හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම

**හෝ**

ii. ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම (HNDE)

**හෝ**

iii. අදාළ විෂයය හෝ ක්ෂේත්‍රය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම (HND)

**හෝ**

iv. අදාළ විෂයය හෝ ක්ෂේත්‍රය සම්බන්ධව පිළිගත් ආයතනයකින් ලබා ගන්නා ලද වසර දෙකක පූර්ණකාලීන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම සහ අදාල ක්ෂේත්‍රයේ වසර 01ක පළපුරුද්දක් තිබීම.

**සටහන :** අදාළ තනතුරේ ස්වභාවය අනුව කෘෂි විද්‍යාව/ සත්ත්ව පාලනය/ ඉංජිනේරු විද්‍යාව / තාක්ෂණය/ වෛද්‍ය රසායනාගාර තාක්ෂණය ආදී විෂයයන් විෂයය ක්ෂේත්‍රය වශයෙන් සලකනු ලබන අතර එම ක්ෂේත්‍රයන්හි පිළිගැනීම අදාල පීඨය විසින් නිර්ණය කරනු ලැබේ.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 35,145 -7×355; 9×495 -42,085.00 [U-MT 1(II)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

**09.** **<u>ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)</u>**
**අවශ්‍ය සුදුසුකම්:**

i. සුදුසුකම් ලත් ඖෂධවේදියකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 31,625 -7×300; 10×355 -37,275.00 [U-MT 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

**10.** **<u>ආරක්ෂක සේවා පරීක්ෂක (II ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

i. (අ) අ.පො.ස. (සා.පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථයන් පහ (05)ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වී තිබීම. සම්මාන ලත් විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය ඇතුළත් විය යුතුය.

**හෝ**

(ආ) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකින් (06) කින් සමත් වී ඇති විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක ස්ථිර සේවයක් තිබෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සේවකයෙකු වීම. එසේ සමත් වූ විෂයයන්ට සිංහල/ දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/ වාණිජ අංක ගණිතය/ ගණිතය ඇතුළත් විය යුතුය.

**සහ**

ii. පොලිස් සේවයේ හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ආරක්ෂක සේවයේ හෝ වෙනත් පිළිගත් ආරක්ෂක සේවා ආයතනයක වසර පහ (05)කට නොඅඩු සතුටුදායක සේවයක් සපුරා තිබිය යුතුය.

iii. ක්‍රීඩා කටයුතුවල ක්‍රියාශීලී සහභාගීත්වය තිබිය යුතුය.

iv. උස: අඩි 05 අඟල් 04 කට නොඅඩු විය යුතුය.
පපුව: අඟල් 34 කට නොඅඩු විය යුතුය. (සාමාන්‍ය)

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.

**වැටුප් ක්‍රමය:** 30,725 - 17×300 - 35,825.00 [U-MN 1(IIIA)] මාසික වැටුප් පරිමාණය හිමි වේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද සඳහා හිමිකම් ලබයි.

විශ්වවිද්‍යාල සේවකයින් සිය මාසික මූලික වැටුපෙන් 10% කින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු අතර, විශ්වවිද්‍යාලය මගින් 15% කට සමාන මුදලක් (8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප සඳහා ද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද බැර කෙරේ. විශ්වවිද්‍යාල පද්ධතියෙහි පත්වීම් දිනයේ සිට අනිවාර්ය විශ්‍රාම යාමේ දිනය දක්වා, එනම් වයස අවු. 60 දක්වා වසර 20 ක සේවා කාලයක් සම්පූර්ණ කිරීමට නොහැකි වන කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුපට දායක නොවන අතර, එම කාර්ය මණ්ඩලය විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙහි සාමාජිකත්වය ද නොදරයි.) දායක කරනු ලැබේ.තවද ආයතනය විසින් මූලික වැටුපෙන් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා බැර කරනු ලැබේ.

**අයදුම්පත් නිකුත් කිරීම සහ භාර ගැනීම:**

අයදුම්කරුවන් විසින් ස්වකීය ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියට පිවිසීමෙන් (www.ruh.ac.lk) නියමිත ආකෘති පත්‍රය හා බඳවා ගැනීම් පරිපාටියට අදාළ තොරතුරු ලබාගත හැකිය 2021.10.22 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘතිය භාවිතා කර විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර."** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අසම්පූර්ණ හෝ අපැහැදිලි හෝ ඉහත සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සපුරා නොතිබීම හෝ නියමිත දිනට පෙර එවීමට අපොහොසත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කවර හේතුවක් නිසා හෝ නැවත සලකා බැලීමට අවකාශ නොමැත.

රාජ්‍ය/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මඟින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, එසේ ඉදිරිපත් කරනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රුහුණ විශ්වවිද්‍යාලය, ලේඛකාධිකාරී
වැල්ලමඩම,
මාතර.

2021.10.05